# ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

# තනතුරු පුරප්පාඩු

## දිස්ත්‍රික් කොමසාරිස් තනතුර සඳහා ස්ථිර පදනම මත,

### (නියෝජ්‍ය / සහකාර කොමසාරිස් තනතුර සඳහා ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවා ගැනීම)

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දිවයින පුරා ස්ථාපිත දිස්ත්‍රික් කාර්යාලවල පුරප්පාඩුව පවතින දිස්ත්‍රික් කොමසාරිස් තනතුර සඳහා දැනට සේවයේ නිරත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ස්ථිර පදනමින් හා ප්‍රාදේශීය කාර්යාලවල පුරප්පාඩුව පවතින නියෝජ්‍ය / සහකාර කොමසාරිස් තනතුරු සඳහා දැනට සේවයේ නිරත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II හා III ශ්‍රේණියේ නිලධාරීන් ස්ථිර පදනමින් හා විශ්‍රාමික ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනේ.

**දිස්ත්‍රික් කොමසාරිස් තනතුරු පුරප්පාඩුව පවතින දිස්ත්‍රික් කාර්යාල -**

ගම්පහ, මහනුවර හා කුරුණෑගල.

**01. තනතුර - දිස්ත්‍රික් කොමසාරිස් (ස්ථිර පදනමෙන්)**

I. **සුදුසුකම්** - ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

**නියෝජ්‍ය / සහකාර කොමසාරිස් තනතුරු පුරප්පාඩුව පවතින ප්‍රාදේශීය කාර්යාල -**

වලිකාමම් නැගෙනහිර (කෝපායි), බියගම, ජා ඇල / වත්තල, මීගමුව, ගොඩකවෙල, කුණ්ඩසාලේ, පූජාපිටිය, අඹගමුව කෝරළේ, මිහින්තලය, තඹුත්තේගම, හක්මන, තංගල්ල, අලව්ව, පොල්ගහවෙල, මාවතගම, ඉබ්බාගමුව, නිකවැරටිය, නමුණුකුල, ලංකාපුර, පල්ලෙපොල, කල්පිටිය, තාන්තන්ඩිය, හොරණ, මීරිගම, ගලේවෙල, මිනිපේ, කුරුණෑගල, මොණරාගල, කුරුවිට, රත්නපුර, බලංගොඩ, බේරුවල, හික්කඩුව / ඇල්පිටිය, වැලිපිටිය, කෑගල්ල, හංවැල්ල, මහරගම, කෝට්ටේ, දෙහිවල, තාළල, ඉඹුල්පෙ හා පොළොන්නරුව.

**02. තනතුර - නියෝජ්‍ය / සහකාර කොමසාරිස් (ස්ථිර පදනමෙන්)**

I. **සුදුසුකම්** - ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II හෝ III ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

**03. තනතුර - සහකාර කොමසාරිස් (කොන්ත්‍රාත් පදනමෙන්)**

I. **සුදුසුකම්**
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු වීම.
- රාජ්‍ය සේවයේ විධිමත්ව විශ්‍රාම ගැන්වූ පුද්ගලයෙකු වීම.
- සේවා කාලය තුළ විනය දණ්ඩනයකට ලක් වී නොතිබිය යුතුය.
- අවු. 60 – 67 අතර විය යුතුය.
- කායික හා මානසික සෞඛ්‍ය යහපත් විය යුතු අතර, සේවයට යෝග්‍ය බව සනාථ කිරීම සඳහා මෑතකදී ලබාගත් වෛද්‍ය සහතිකයක් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

II. **තෝරා ගන්නා ආකාරය**
- සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශවලට අනුකූලව සුදුසුකම්ලත් නිලධාරීන් තෝරා ගැනීම සිදු කරයි.

III. **දීමනා හා අනෙකුත් පහසුකම්**
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 ට අනුව දීමනා හා අනෙකුත් වරප්‍රසාද ලබා දෙනු ඇත.

**අයදුම් කළ යුතු ආකාරය**

අයදුම් කිරීමට අපේක්ෂා කරන සේවයේ යෙදී සිටින නිලධාරීන් තමාගේ අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් ද විශ්‍රාමික නිලධාරීන් තමන් විසින් සකස් කර ගත් ජීව දත්ත පත්‍රිකාවක් 2020/09/30 දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. යොමු කරන අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩු පවතින තනතුරු සඳහා අයදුම් කිරීම යනුවෙන් සඳහන් කළ යුතුය.

**ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්,**
**ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව,**
**අංක 1200/6, "මිහිකත මැඳුර".**
**රජමල්වත්ත පාර, බත්තරමුල්ල.**